# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2498/79 - 2026 ජූලි මස 24 වැනි සිකුරාදා - 2026.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ**

**කොළඹ මහා නගර සභාවේ**

**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොටගෙන, කොළඹ මහා නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කොළඹ මහා නගර සභාවේ අංක 06 - ලුණුපොකුණ, කොට්ඨාසයට තේරී පත්වූ ශේන් ඩැනියල් රාම් මහතා අයත් වන්නා වූ සමගි ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ 30 ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කොළඹ මහා නගර සභාවේ අංක 06 - ලුණුපොකුණ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා මාරකන්දගේ රුක්ෂාන් පෙරේරා මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කොළඹ මහා නගර සභාවේ තේරීම්භාර නිලධාරි පියුමි ආටිගල වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් මාරකන්දගේ රුක්ෂාන් පෙරේරා මහතා කොළඹ මහා නගර සභාවේ අංක 06 - ලුණුපොකුණ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**පියුමි ආටිගල,**
තේරීම්භාර නිලධාරි,
කොළඹ මහා නගර සභාව.

2026 ජූලි මස 24 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය.
කොළඹ නාගරිකය.

EOG 07 - 0369

1A - PG 7841 — 04 (2026/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*